රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2020

මගේ අංකය : EST-1/MISCL/06/0032
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.04.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**කෝවිඩ්-19 වෛරසය පවතින කාලය තුළ රාජ්‍ය ආයතන විවෘත කර කාර්යාලයීය කටයුතු ආරම්භ කිරීම සහ එම කටයුතු පවත්වාගෙන යාම**

"කෝවිඩ්-19 වෛරසය පවතින කාලය අතරතුර සාමාන්‍ය දෛනික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික්ක විවෘත කිරීමේ දී රාජ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ" මැයෙන් අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 සහ 2020.04.18 දිනැතිව ජනාධිපති ලේකම් විසින් නිකුත් කළ චක්‍රලේඛයෙහි සඳහන් මාර්ගෝපදේශ වෙත අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ හා සමගාමීව සේවා ස්ථානවලට නිලධරයන් සහ මහජනතාව කැඳවීමේ දී පහත මාර්ගෝපදේශ ද අනුගමනය කළ යුතු ය.

(අ) කාර්යාලයට ප්‍රවේශවීමට පෙර පිරිසිදුවීම සඳහා සබන් සහ සේදුම් පහසුකම් සැපයිය යුතු ය. රජයේ වියදමින් මුඛ ආවරණ, සනීපාරක්ෂක සේදුම්, විෂබීජ නාශක සහ sanitizer ලබා දීම සඳහා වැඩපිළිවෙළක් යෙදිය යුතු ය.

(ආ) අවශ්‍යවන්නේ නම් අත්වැසුම් සැපයීමට ද විෂබීජහරණ කුටි ස්ථාපිත කිරීමට ද කටයුතු කළ යුතු ය.

(ඇ) නිලධරයන්ගේ ඇඳුම් හා අනෙකුත් පැළඳුම් ඔවුන් කොරෝනා වෛරසයට නිරාවරණය වීමට හේතු විය හැකි බැවින් මෙම කාල සීමාව තුළ සංවර සරල ඇඳුමකින් සැරසී කාර්යාල පරිශ්‍රය වෙත පැමිණීමටත් අත්‍යවශ්‍ය නොවන පැළඳුම් නොපැළඳීමටත් නිලධරයන් ක්‍රියා කළ යුතු ය.

උදා: කාන්තා නිලධාරිනියන් සඳහා සාරිය හෝ ඔසරිය ඇඳීම අනිවාර්ය නොවන අතර පිරිමි මාණ්ඩලික නිලධරයන්ට ටයි පටිය පැළඳීම අනිවාර්ය නොවේ.

(ඈ) ගර්භනී සහ මව්කිරි දෙන නිලධාරිනියන් මෙම කාල සීමාව තුළ දී සේවයට කැඳවීමේ දී සහනශීලී පිළිවෙතක් අනුගමනය කළ යුතු අතර මැයි මස අවසන් වන තෙක් ඔවුන් සේවයට කැඳවීමෙන් හැකිතාක් දුරට වැළකිය යුතු ය. ඔවුන් සේවයට කැඳවන්නේ නම් ආසන්න සේවා ස්ථානවලට අනුයුක්ත කිරීමට ඉඩ සැලසිය යුතු ය. මෙලෙස අනුයුක්ත කිරීමට ඉල්ලා සිටින නිලධාරිනියන් තමා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතු අතර එසේ අනුයුක්ත කර සිටින කාලය තුළ එම නිලධාරිනියන්ගේ වැටුප ඔවුන්ගේ නිත්‍ය සේවාස්ථානය මඟින් ගෙවීමට කටයුතු කළ යුතු ය.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය